**ශීර්ෂය 130 - රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 130 - රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 29 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 මැයි 31 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්**,** ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

#### (අ) ආදායම් ලැබීම්

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ඇතැම් ආයතන විසින් එකතු කරනු ලබන රජයේ වත්කම්වලින් ලැබෙන ගොඩනැගිලි කුලී ආදායම, උක්ත ආදායම් සංකේතාංකය යටතේ රාජ්‍ය ආදායමට බැර නොකරන අවස්ථා පවතින බව විගණනයට නිරීක්ෂණය විය. ඒ අනුව ආයුර්වේද දෙපාර්තමේන්තුව විසින් 2022 වර්ෂය තුළදී සංචාරක නිවාස හා නේවාසිකාගාරවලින් රැස්කර තිබුණු රු.1,298,432ක් 20.02.01.01 දරන ආදායම් සංකේතාංකය යටතේ රාජ්‍ය ආදායමට බැර නොකර වෙනත් ආදායම් සංකේතාංක යටතේ රාජ්‍ය ආදායමට බැරකර තිබුණි. | ආයුර්වේද දෙපාර්තමේන්තුව විසින් සංචාරක නිවාස හා නේවාසිකාගාර වලින් අයකරන ලද ආදායම ඉදිරියේදී ආදායම් සංකේතාංක 20.02.01.01 ට බැර කර නිවැරදි කරන බව දන්වා ඇත. | රජයේ ගොඩනැගිලි හා නිවාස කුලී ආදායම් නිවැරදි ආදායම් සංකේතාංකය යටතේ රාජ්‍ය ආදායමට බැර කර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |

#### (ආ) මූලධන වියදම්

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2021 ජුනි - ඔක්තෝබර් කාල පරිච්ඡේදය තුළ පදිංචිය සඳහා වෙන්කරදී තිබූ කොළඹ, මොණරාගල සහ මහනුවර නිල පියස 03ක ඉදිකිරීමේ මුළු වියදම රු.1,311,795,048 ක් ගොඩනැගිලි යටතේ ප්‍රාග්ධනිත නොකර මූල්‍ය ප්‍රකාශනවල නොනිමි වැඩ ලෙස දක්වා තිබුණි. | ප්‍රාග්ධනිත කිරීමට භාණ්ඩාගාරයට දන්වා ඇත. | ඉදිකිරීම් අවසන් කර භාවිතයට ගනු ලබන ගොඩනැගිලි නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

(ඇ) **රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | 2022 දෙසැම්බර් 31 දිනට රජයේ නිලධාරීන්ට අත්තිකාරම් බී ගිණුමේ පාලන ගිණුම අනුව ශේෂය රු.1,802,048,070ක් වුවද, භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත අනුව ශේෂය රු.1,801,972,683ක් හා කේවල ශේෂ ලැයිස්තුව අනුව එදිනට අයවිය යුතු ණය ශේෂය රු.1,805,321,977ක් වූයෙන් පිළිවෙලින් රු.75,387ක හා රු.3,273,907ක වෙනසක් විය. | රු.75,387ක වෙනස නිවැරදි කිරීමට කටයුතු කර ඇත. භාණ්ඩාගාර මුද්‍රිත පිටපත් අනුව ශේෂය හා කේවල ශේෂ ලැයිස්තුව අනුව අයවිය යුතු ණය ශේෂ අතර වෙනස රු.3,273,907 වන බවට එකඟ වෙමි. | දෙපාර්තමේන්තු පොත් අනුව ශේෂයන්, භාණ්ඩාගාර පොත් සමග අඛණ්ඩව සැසඳීම් සිදුකොට වෙනස්කම් ඇති නොවීමට වගබලා ගත යුතුය. |
| (ii) | ඒකාබද්ධ ශේෂ පිරික්සුමට අනුව මුදලින් හා හරස් සටහන් මගින් අත්තිකාරම් අයකර ගැනීම් හා අත්තිකාරම් ගෙවීම් පිළිවෙලින් රු.2,562,501,774ක් හා රු.2,572,631,983ක් වුවද, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ එම අගයන් පිළිවෙලින් රු.47,104,446ක් හා රු.57,234,654ක් ලෙස දක්වා තිබුණි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය වෙත අත්තිකාරම් අයකර ගැනීම් හා අත්තිකාරම් ගෙවීම් දැක්වීමේදී මුදල් පොත අනුව දැක්විය යුතු අගයන් දැක්විය යුතු නිසා එම ජ'නල්වල බලපෑම ඉවත් කිරීම සිදුකරන ලදී. | ඒකාබද්ධ ශේෂ පිරික්සුමේ ඇතුළත් මුදලින් හා හරස් සටහන් මගින් අත්තිකාරම් අයකර ගැනීම් හා අත්තිකාරම් ගෙවීම් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අත්තිකාරම් අයකර ගැනීම් හා අත්තිකාරම් ගෙවීම් යටතේ දැක්විය යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2015 ජූලි 20 දිනැති අංක 01/2015 දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛයේ 03 ඡේදයෙහි සඳහන් ක්‍රියාමාර්ග අනුගමනය කරමින් ආදායම් ඇස්තමේන්තු නිවැරදිව හා තාත්විකව පිළියෙල කළයුතු වුවද, සංශෝධිත ඇස්තමේන්තුව අනුව සමාලෝචිත වර්ෂයේ රජයේ ගොඩනැගිලිවලින් රැස්කිරීමට අපේක්ෂිත කුලී ආදායම රු.1,300,000,000ක් වුවද, රැස්කළ තථ්‍ය ආදායම රු.1,504,677,796ක් වූයෙන් ඇස්තමේන්තු කළ ආදායම හා තථ්‍ය ආදායම අතර සියයට 16 ක එනම් රු.204,677,796ක වාසිදායක විචලනයක් විය. | 2022 වර්ෂයේ වසා තිබූ නිල නිවාස නැවත ලබාදීම සහ නව නිවාස යෝජනා ක්‍රම යටතේ නිල නිවාස නිලධාරීන්ට ලබාදීම නිසා සංශෝධිත ආදායම් ඇස්තමේන්තුවට වඩා සත්‍ය ආදායම රු.204,677,796 කින් වැඩිවිය. | චක්‍රලේඛ ප්‍රකාරව ආදායම් නිවැරදිව පුරෝකථනය කළ යුතුය. |
| (ආ) | 2015 ජූලි 20 දිනැති අංක 01/2015 දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛයේ 4 (ආ) ඡේදය ප්‍රකාරව ආදායම් ගණන්දීමේ නිලධාරීන් විසින් හිඟ ආදායම් එකතු කර ගැනීමට කටයුතු කිරීම සහ අයවීමට ඇති හිඟ ආදායම් තව තවත් එකතුවීම වැළැක්වීම සඳහා ක්ෂණිකව පියවර ගතයුතු වුවත් ආයතන 29 | ඇතැම් අයකර ගතනොහැකි හිඟ නිවාස කුලිය සම්බන්ධයෙන් රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීම් කර ඇති අතර අයකර ගත හැකි අනෙකුත් හිඟ ආදායම්, අයකර ගතහැකි සියලු ආකාරයෙන්ම අයකර ගැනීමට කටයුතු කිරීමෙන් පසුව මු.රෙ.113 පරිදි කටයුතු | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුවීම හා හිඟ ආදායම් අයකර ගැනීමට කඩිනම් ක්‍රියාමාර්ග ගතයුතුය. |

| | | |
|---|---|---|
| කින් 2022 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ගොඩනැගිලි හිඟ කුලී ආදායම රු.341,748,077ක් වී තිබූ අතර, ඉන් 2019 දෙසැම්බර් 31 දිනට පෙර වර්ෂවල සිට අයවිය යුතුව පවතින හිඟ ආදායම් රු.194,578,337ක් විය. මෙම හිඟ කුලී ආදායම ඉකුත් වර්ෂයේ සංඛ්‍යා හා සැසඳීමේදී රු.18,901,344ක වැඩිවීමක් නිරීක්ෂණය විය. උක්ත හිඟ කුලී මුදලින් සියයට 22ක් හෙවත් රු.74,210,789ක් රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය යටතේ පාලනය වන රජයේ බංගලා, සංචාරක බංගලා සහ නිල නිවාසවලින් අයවිය යුතුව පැවතුන අතර රජයේ බංගලා සහ නිල නිවාස 110කින් අයවිය යුතු හිඟ නිවාස කුලී ආදායම රු.72,108,339ක් විය.<br>මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් ද කරනු ලැබේ. | කරනු ඇත. | |
| i. 2022 දෙසැම්බර් 31 දිනට ඇමතිවරුන් සහ මන්ත්‍රීවරුන් 74 දෙනෙකුගෙන් රු.4,590,791 ක හිඟ කුලී මුදලක් අයවිය යුතුව පැවතුන අතර එම ශේෂය තුළ 2015 වර්ෂයේ සිට පැවත එන රු.1,406,586ක් වූ ශේෂ 19ක්ද විය. | හිඟ ආදායම් අයකිරීමට කඩිනමින් පියවර ගන්නා ලෙස අදාල ආයතන ප්‍රධානීන් වෙතද, අධ්‍යක්ෂ (මුදල්), ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව වෙතද හිඟ නිවාස ලාභීන්ගේ දුරකතනවලට ඇමතීම සහ පෞද්ලික ලිපින වලට ලිපි යොමු කිරීමට ද නිරන්තරයෙන් කටයුතු කර ඇත. | නිවාස කුලී අයකර ගැනීමට කඩිනමින් ක්‍රියාමාර්ග ගැනීම හා හිඟකුලී තව තවත් එකතු වීම වැලැක්වීම සඳහා ක්ෂණිකව පියවර ගතයුතුය. |

| | | | |
|---|---|---|---|
| ii. | සමූළ නිවාස 48කින් 2022 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු හිඟ කුලී මුදල රු.4,131,259ක් වූ අතර එයින් රු.2,468,657ක් වූ ශේෂ 45ක් 2012 සිට 2021 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයට අදාළව අයනොවී පවතින හිඟ ශේෂ විය. තවද ජයවඩනගම නිවාසවල 2012 සිට 2021 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ පදිංචිව සිටි නිලධාරීන් 18 දෙනෙකුගෙන් 2022 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු හිඟකුලී එකතුව රු.8,897,555ක් අයකර ගෙන නොතිබුණි. | 2023.05.17 දින වනවිට සමූළ නිවාසලාභීන් 30 දෙනෙකුගෙන් නිවාස 14ක රු.1,305,548ක මුදලක් අයකරගෙන ඇත. එයින් රු. 2,468,657 ක්වූ ශේෂ 45ක් 2012-2021 කාලපරිච්ඡේදයට අදාළව අයනොවී පවතින හිඟ මුදලින් 2023.05.16 දින වනවිට අයකරගෙන ඇති මුදල රු.271,916 කි.<br><br>ජයවඩනගම නිවාසවල හිඟ නිවාස කුලී අයකර ගැනීම සඳහා අදාල නිළධාරීන්ගේ දුරකතන අංකවලට ඇමතීම සහ පෞද්ගලික ලිපිනවලට ලිපි යොමු කිරීමට කටයුතු කර ඇත. ඇතැම් නිළධාරීන් රාජකාරී කළ ආයතනවලින් මාසික නිවාස කුලී අයකර ඇතත් නිසි පරිදි වාර්තා නොකිරීම හේතුවෙන් හිඟ ලෙස සටහන්ව ඇති බවද නිරීක්ෂණය වී ඇත. | -එම - |
| iii. | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත වෙන්කර දී තිබූ බංගලා නිවාසයකින් 2012 වර්ෂයේ සිට අයවිය යුතු රු.36,042,000ක ශේෂයක් හා නිදන්ගත වකුගඩු රෝග වැළැක්වීමේ පර්යේෂණ | හිඟ ආදායම් අයකර ගැනීම පිළිබඳව තවදුරටත් කටයුතු කරමින් පවතී. | නිරන්තරයෙන් පසුවිපරම් සිදුකර හිඟකුලී අයකර ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගතයුතුය. |

ලේකම් කාර්යාලයට ලබා දී තිබූ නිවාසයකින් 2015 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයට අදාළව අයවිය යුතු රු.14,798,387ක ශේෂයක් නිරවුල් කිරීමකින් තොරව දිගින් දිගටම පැවතුණි.

## 2.2 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පුනරාවර්තන වැය විෂයයන් 05ක් සඳහා මුදල් රෙගුලාසි 66 යටතේ මාරුකර තිබූ රු.45,237,900ක් වූ සම්පූර්ණ ප්‍රතිපාදනයම හා පුනරාවර්තන වැය විෂයන් 04ක් සඳහා මාරුකර තිබූ ප්‍රතිපාදනවලින් රු.7,045,846ක් උපයෝජනය කර නොතිබුණි. තවද, මූලධන වැය විෂයයන් 03ක් සඳහා මාරුකර තිබූ එකතුව රු.181,723,000ක ප්‍රතිපාදනවලින් එකතුව රු.156,737,488ක් උපයෝජනය නොකර ඉතිරි කර තිබුණි. | මෙම ප්‍රතිපාදන මාරු කිරීම භාණ්ඩාගාරය හරහා ක්‍රියාත්මක වන දත්ත පද්ධතියක් මගින් සිදුවන අතර මු.රෙ. 66 ප්‍රකාරව භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ අනුමැතිය අවශ්‍ය වන සියලුම මාරු කිරීම් භාණ්ඩාගාර අනුමැතිය ලැබීම මත අදාළ පද්ධතියේ මාරු වීම ස්වයංක්‍රීයව සිදු වේ. | මුදල් රෙගුලාසි 50 (ii) ප්‍රකාරව ඇස්තමේන්තු හැකිතාක් නිවැරදිව පිළියෙල කිරීමටත් චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කිරීමටත් කටයුතු කළ යුතුය. |

## 2.3 බැරකම් හා බැඳීම්වලට එළඹීම

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මූල්‍ය ප්‍රකාශනවල සටහන් iii ට අනුව 2022 දෙසැම්බර් 31 දිනට බැරකම් ශේෂය රු.2,720,644,374ක් වුවද භාණ්ඩාගාර පරිගනක මුද්‍රිත අනුව එදිනට බැරකම් ශේෂය රු.2,713,281,897ක් පැවතීමෙන් වෙනස රු.7,362,877ක් විය. | මෙම බැරකම් 2022 වර්ෂයේ ගිණුම් පියවීමේ ක්‍රියාවලියෙන් පසුව ලද ලද වවුචර්පත් වලට අදාළ බැවින් එම බැරකම් CIGAS වැඩසටහනට ඇතුළත් නොවේ. | බැරකම් නිවැරදිව හඳුනාගෙන නියමිත දිනට පෙර භාණ්ඩාගාරය වෙත වාර්තා කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට බැරකම් යටතේ ගිණුම්ගත කර නොතිබුණු පිබිදෙමු පොළොන්නරුව වැඩසටහනෙහි ඉකුත් වර්ෂවලට අදාළ වියදම් සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.680,000,000ක් ගෙවා තිබුණි. | බැරකම් කරන ලද අතැති බිල්පත් සඳහා 2020 හා 2021 වර්ෂ වලදී ප්‍රමාණවත් පරිදි ප්‍රතිපාදන නොලැබීම මත 2022 වර්ෂයේදී ලද ප්‍රතිපාදන මුදලින් අදාල වවුචර්පත් පියවීමට කටයුතු කර ඇත. | ගෙවිය යුතු වියදම් සඳහා බැරකම් ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 විදේශ ආධාර ව්‍යාපෘති

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | යාපනයේ Incubator සඳහා ව්‍යාපාරික මධ්‍යස්ථානයක් ක්‍රියාත්මක කිරීමට මෘදුකාංග පද්ධතියක් හඳුන්වා දීම සඳහා මූලධන වැය විෂයයක් යටතේ විදේශ ප්‍රදාන මගින් රු.200,000,000ක් ද, විදේශ මූල්‍යකරණ වැය විෂයය යටතේ රු.40,000,000ක් ද වශයෙන් එකතුව රු.240,000,000ක් වූ ප්‍රතිපාදන සලසාගෙන තිබුණද සමස්ථ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි. | විවිධ ප්‍රායෝගික හේතුමත අදාළ අවබෝධතා ගිවිසුම හා ආධාර මුදල සක්‍රීය කරවීමට නොහැකි වීමෙන් මේ සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන ඉතිරි විය. | විදේශ සහ දේශීය අරමුදල් මඟින් සලසාගත් ප්‍රතිපාදන සැලැසුම් සහගතව ප්‍රශස්ථ මට්ටමින් උපයෝජනය කිරීමට ක්‍රියාමාර්ග ගතයුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මහ කොළඹ ජලය සහ අපජලය කළමනාකරණ වැඩිදියුණු කිරීමේ වැඩසටහන අදියර 03 ක්‍රියාත්මක කිරීම සඳහා මූලධන වැය විෂයයක් යටතේ යුරෝපීය ආයෝජන බැංකු (යු.ආ.බැ.) ණය මගින් රු.600,000,000ක හා විදේශ මූල්‍යකරණ වැය විෂයය යටතේ රු.50,000,000ක ප්‍රතිපාදන සලසාගෙන තිබුණද, කොන්ත්‍රාත් ප්‍රදානය කර නොතිබීම හේතුවෙන් සැලසුම්කළ පරිදි ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි. එසේ වුවද යු.ආ.බැ. ණය යටතේ සලසාගත් ප්‍රතිපාදනයෙන් රු.477,700,000ක් මෙම වැඩසටහනේ අදියර 02 සඳහා මාරු කර සම්පූර්ණ මුදලම වියදම් කර තිබුණි. | කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමේ ප්‍රමාදය මත 2022 වර්ෂය සඳහා වෙන්කරන ලද ප්‍රතිපාදන උපයෝජනය කිරීමට නොහැකි විය. ඒ අනුව එකම විෂය පථය යටතට ගැනෙන අපජල නාලිකාවල තත්ත්ව නිරීක්ෂණය කිරීමේ කොන්ත්‍රාත්තුව සඳහා 2022 වර්ෂයට සලසා තිබූ ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම හේතුවෙන් ඉහත කාර්ය සඳහා වෙන්කර තිබූ ප්‍රතිපාදන අදාල මුදල් රෙගුලාසි යටතේ මාරුකර වියදම් දරා ඇත. | -එම - |
| (ඇ) | මහ කොළඹ ජලය සහ අපජලය කළමනාකරණය වැඩිදියුණු කිරීම සඳහා වූ ආයෝජන වැඩසටහනෙහි 03 වන කොටස ක්‍රියාත්මක කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකු (ආ.ස.බැ.) ණය යටතේ සලසාගෙන තිබුණු රු.200,000,000ක ප්‍රතිපාදනවලින් සියයට 55ක් වූ රු.110,151,712ක් ද, මෙම වැඩසටහන තුළ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ආ.ස.බැ. ණය යටතේ සලසාගෙන තිබුණු රු.1,000,000,000ක ප්‍රතිපාදනවලින් සියයට 58ක් වූ රු.576,429,501 ක් ද, විදේශ මූල්‍යකරණ | කිරුළපන ප්‍රදේශයේ අපජල පොම්පාගාර හා නළ පද්ධතිය වැඩිදියුණු කිරීමේ කොන්ත්‍රාත්තුව, අදාළ සැලසුම්වල ඌනතාවය හා මිලගණන් අධික ලෙස ඉහළ යාම නිසා කොන්ත්‍රාත්කරු විසින් වසරේ මැද භාගයේදී පමණ වැඩ අත්හිටුවීම හේතුවෙන් අරමුදල් උපයෝජනය අඩුවීමත්, මෙම වැඩසටහන යටතේ ක්‍රියාත්මක කිරීමට යෝජිතව පැවති වැල්ලවත්ත අපජල පිරිපහදු යන්ත්‍රාගාරයේ කටයුතු ඉඩම් | -එම- |
| | වැය විෂයය යටතේ සලසාගෙන තිබූ රු.200,000,000ක ප්‍රතිපාදනවලින් සියයට 79 ක් වූ රු.157,358,855ක් ද, අරමුණුගත කාර්යය සඳහා උපයෝජනය කර නොතිබුණි. විදේශීය මූල්‍යකරණ වැය | පවරාගැනීමේදී සිදුවූ මහජන විරෝධය මත ප්‍රමාදවීමත්, අදාල ණය අරමුදල් කාලය 2022 ඔක්තෝම්බර් මස අවසන් වීමත් හේතුවෙන් අදාල ඉදිකිරීම් නවතා | |

| | | | |
|---|---|---|---|
| | විෂයය මඟින් සලසාගෙන තිබූ ප්‍රතිපාදනවලින් රු.8,302,600ක් වෙනත් වැය විෂයයන්ට මාරුකර වියදම් කර තිබුණි. | දැමීමට සිදුවීම මත 2022 වර්ෂය සඳහා වෙන්කරන ලද ප්‍රතිපාදනවල ඉතිරි වීම් ඇතිවිය. | |
| (ඇ) | ප්‍රාදේශීය සංවර්ධන සහාය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ලෝක බැංකු ණය යටතේ රු.1,900,000,000ක් ද, ප්‍රදාන යටතේ රු.1,400,000,000ක් ද, විදේශ මූල්‍යකරණ වැය විෂයය යටතේ රු.50,000,000ක් ද වශයෙන් ප්‍රතිපාදන සලසාගෙන තිබුණද, ලෝක බැංකු ප්‍රදාන යටතේ සලසාගෙන තිබුණු ප්‍රතිපාදනවලින් සියයට 56ක් හෙවත් රු.777,562,462ක ප්‍රතිපාදන ඉතිරිවී තිබුණි. | උප ව්‍යාපෘතිවල මිල විචලනය සඳහා ඇස්තමේන්තුගත කර තිබූ මුදල් ප්‍රමාණය ප්‍රමාණවත් නොවූ නිසා ලෝක බැංකුවෙන් එම මිල විචලනය ගෙවීම සඳහා එකඟතාවයක් ලබාගැනීමට අවශ්‍ය විය. මෙම කටයුතු අවසන් කිරීමට කාලයක් ගතවීම, වෙළඳපොළ අමුද්‍රව්‍යවල පැවති හිඟකම, පවතින ප්‍රසම්පාදන ක්‍රමවේද අනුගමනය කිරීමෙන් පසුව සුදුසු කොන්ත්‍රාත්කරුවන් ඉදිකිරීම් කටයුතු සඳහා සොයාගැනීම අපහසුවීම නිසා සැලසුම් කළ පරිදි නියමිත දිනයන්හි කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමට නොහැකි වීය. | විදේශ සහ දේශීය අරමුදල් මඟින් සලසාගත් ප්‍රතිපාදන සැලැසුම් සහගතව ප්‍රශස්ථ මට්ටමින් උපයෝජනය කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඉ) | ග්‍රාමීය පාලම් ව්‍යාපෘතියෙහි යටිතල පහසුකම් සංවර්ධනය සඳහා නෙදර්ලන්ත රජයේ ණය යටතේ සලසාගෙන තිබුණු රු.300,000,000ක ප්‍රතිපාදනවලින් සියයට 69ක් වැයකර තිබුණද, විදේශ මූල්‍යකරණ වැය විෂයය යටතේ සලසාගෙන තිබුණු රු.12,000,000ක ප්‍රතිපාදනවලින් සියයට 64ක්වූ රු.7,628,461ක ප්‍රතිපාදන ඉතිරිව තිබුණි. | ග්‍රාමීය පාලම් ව්‍යාපෘතියේ අදියර V කොන්ත්‍රාත් ගිවිසුම 2019 වර්ෂයේ පෙබරවාරි මස 22 දින අත්සන් කර තිබුනද, එම කොන්ත්‍රාත් ගිවිසුම බලාත්මකවීම සඳහා සපුරාලිය යුතු අවශ්‍යතා සම්පූර්ණ වූයේ 2021 වර්ෂයේ ජූලි මස 27 දිනය. කොන්ත්‍රාත් ගිවිසුම අනුව යකඩ පාලම් නෙදර්ලන්තයේ සිට ආනයනය කිරීමට නියමිතව තිබුනේ 2022 ජනවාරි/ පෙබරවාරි මසය. ඒ වන විට, යුක්රේනයේ පටන්ගත් යුද්ධයත් සමග කොන්ත්‍රාත්කරුහට | -එම- |

| | | | |
|---|---|---|---|
| | | මෙම යකඩ පාලම් ආනයනය කිරීමට නොහැකි විය. | |
| (ඊ) | උතුරු පළාතේ කිරි කර්මාන්තය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා ජයිකා ආයතනයේ ප්‍රදාන යටතේ රු.10,000,000**ක** හා පළාත් පාලනය ඉහළ නැංවීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවර්ධන ව්‍යාපෘති ප්‍රදාන යටතේ රු.50,000,000**ක** ප්‍රතිපාදන සලසා තිබුණද**,** සමාලෝචිත වර්ෂයේදි එම ව්‍යාපෘති ක්‍රියාත්මක කර නොතිබුණි. | 2022 වර්ෂයේ රටතුළ පැවති අයහපත් ආර්ථික තත්වය හේතුවෙන් රජය විසින් ආනයනයන් දැඩිව සීමා කිරීම නිසා උතුරු පළාතේ කිරි කර්මාන්තය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. | -එම - |
| | | 2022 වර්ෂයේ රටතුළ පැවැති අයහපත් ආර්ථික තත්වය හේතුවෙන් පළාත් පාලනය ඉහළ නැංවීමේ වැඩසටහන සඳහා වෙන් කළ ප්‍රතිපාදන ඉතිරිවී ඇත. | |
| (උ) | අපද්‍රව්‍යවලට වටිනාකමක් එකතු කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ජර්මානු රජයේ ප්‍රදාන යටතේ රු.270,000,000**ක්ද,** විදේශ මූල්‍යකරණ වැය විෂයය යටතේ රු**.**5,000,000**ක්ද** වශයෙන් ප්‍රතිපාදන සලසාගෙන තිබුණද ව්‍යාපෘතිය ආරම්භ කර නොතිබීමෙන් සමස්ථ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි. | 2022 වර්ෂයේ රට තුළ පැවති අයහපත් ආර්ථික තත්වය හේතුවෙන් ව්‍යාපෘති ආරම්භ නොකිරීම නිසා අපද්‍රව්‍යවලට වටිනාකමක් එකතු කිරීමේ ව්‍යාපෘතිය ද ක්‍රියාත්මක කිරීමට නොහැකි වීමෙන් ප්‍රතිපාදන ඉතිරිවී ඇත. | -එම - |

## 3.2 දේශීය අරමුදල්වලින් ක්‍රියාත්මක කළ ව්‍යාපෘති

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| E - ග්‍රාම නිලධාරී ව්‍යාපෘතිය සඳහා සලසාගෙන තිබුණු රු.750,000,000ක ප්‍රතිපාදනවලින් රු.3,320,382ක් පමණක් වැයකර සියයට 99.6ක් හෙවත් රු.746,679,618ක ප්‍රතිපාදන ඉතිරිව තිබුණි. සැපයුම්කරු සමග ගිවිසුම්ගත වීමෙන් පසුව ප්‍රසම්පාදනය අත්හිටුවීම, ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදයන්, අමාත්‍ය මණ්ඩල සංදේශ යොමු කිරීම ප්‍රමාද වීම වැනි විවිධ අඩුපාඩු, 2017 වර්ෂයේ සිට සැලැසුම් කළ පරිදි ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොකිරීමට හේතු ලෙස දක්වා තිබුණි. | 2017 හා 2018 වර්ෂවලදී අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටුවක් මඟින් තරඟකාරී දේශීය මිල දී ගැනීම් සඳහා සුදුසුකම් ලත් සැපයුම්කරු ලෙස තෝරාගනු ලැබූ සමාගම වෙත රු.731,339,000ක් වන (බදු රහිත)මිළකට එම උපාංග ලබා ගැනීමට එකඟව විධිමත්ව ගිවිසුම්ගත වී තිබූ පසුබිමක එකී ක්‍රියාවලිය අත්හිටුවීමට පසුව පත් කළ CAPC තීරණය කරන කරන ලදි.<br>උක්ත CAPC තීරණය අනුව යොමු කිරීම තරමක් ප්‍රමාද වූ අතර, එකී ප්‍රදානය වෙනුවෙන් හෝ යෝජිත විකල්ප ක්‍රමවේද වෙනුවෙන් 2022 සංශෝධිත ව්‍යාපෘති ප්‍රතිපාදන වූ රු. මිලියන 750න් ප්‍රමාණවත්<br><br>ප්‍රතිපාදන ඉතිරිව තබා ගැනීමට කටයුතු කරන ලදි.<br>ග්‍රාම නිලධාරී කොට්ඨාස 7,000ක පිරවූ ගෘහ / පුරවැසි දත්ත පත්‍රිකා එකතු කිරීම හා පරිලෝකනය සඳහා වන ප්‍රසම්පාදනය වෙනුවෙන් රු.මිලියන 309ක මුදලක් ඇස්තමේන්තු ගත කර මුල දී ප්‍රතිපාදන වෙන් කරන ලද අතර, ඉදිරිපත් වූ ලංසුකරුවන් දෙදෙනාම තාක්ෂණික කාරණා අනුව එම ප්‍රසම්පාදනය සඳහා සුදුසුකම් නොලබන ලද නිසා ද කොන්ත්‍රාත් ප්‍රදානයක් නොවූ බැවින් හඳුනා ගත් ව්‍යාපෘති ප්‍රතිපාදන ඉතිරි විය. | සලසාගත් ප්‍රතිපාදන සැලැසුම් සහගතව අදාළ කාර්යය සඳහා උපයෝජනය කළයුතුය. |

### 3.3 වත්කම් කළමනාකරණය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 දෙසැම්බර් 31 දින ස්ථාන මාරුවී ගිය අමාත්‍යාංශ ලේකම් විසින් අමාත්‍යාංශයට අයත් Toyota Land Cruiser V8 දරන රථය රැගෙන ගොස් තිබුණද එම රථය විධිමත්ව ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය වෙත පවරා දීමට හෝ ආපසු ලබා ගැනීම සිදුකර නොතිබුණි. | එම රථය මෙම අමාත්‍යාංශය වෙත භාර දීමට කටයුතු කරන ලෙස දැනුම් දී ඇති මුත් මේ වන තෙක් භාර දීමට කටයුතු කර නොමැත. | රාජ්‍ය වත්කම්වල පැවැත්ම හා අයිතිය තහවුරු කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | කතරගම නිවාඩු නිකේතනයේ බිම් මහලේ කාමර 17ක් හා පොළොන්නරුව නිවාඩු නිකේතනයේ කාමර 03ක් විවිධ අඩුපාඩු හේතුවෙන් භාවිතා කළ නොහැකි තත්ත්වයට පත් වී තිබුණි. | කතරගම නිවාඩු නිකේතනයේ ජලය කාන්දුවීම සම්බන්ධයෙන් අවශ්‍ය ඉදිරි කටයුතු කරමින් පවතින අතර වායු සමීකරණ අළුත්වැඩියා කිරීමට විශාල මුදලක් වැයවන බැවින් රටෙහි පවතින ආර්ථික අර්බුදයත් සමඟ එය සිදු කිරීම තාවකාලිකව නතර කරන ලදි.<br><br>විදුලි රැහැන් පද්ධතියේ දෝෂය පිළිබඳ අවශ්‍ය කඩිනම් ක්‍රියාමාර්ග ගන්නා ලෙසට දැනුවත් කිරීම් සිදුකර ඇත. | රාජ්‍ය වත්කම්වල පැවැත්ම හා ආරක්ෂාව තහවුරු කිරීමට කඩිනමින් ක්‍රියාමාර්ග ගතයුතු වීම හා වත්කම් පූර්ණ උපයෝජනයකින් යුතුව භාවිතා කළයුතුය. |
| (ඇ) | කැප්පෙටිපොල මාවතේ සමුළු නිවාස කඩා ඉවත් කර නව නිවාස සංකීර්ණයක් ඉදිකිරීම සඳහා 2008 වර්ෂයේදි රු.මිලියන 322ක් ලබාදී තිබුණද ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි. තවද, 2008 වර්ෂයේ සිට මේ දක්වාම | මේ සඳහා ඉදිරි කටයුතු කිරීමට සටහන් කර ඇත. | නව නිල නිවාස සංකීර්ණ ඉදිකිරීමට හා සියලු නිවාස පරිපාලනය අමාත්‍යාංශය සතු විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කඩා ඉවත්කිරීමට යෝජිත ලෙස නම් කර මේ වන විට වසර 15කට අධික කාලයක් ගතවී තිබුණු කැප්පෙටිපොල මාවතේ සමුළු නිවාස 11ක් 2009 වර්ෂයේ සිට මේ දක්වාම තාවකාලික පදනම මත ජනාධිපති ආරක්ෂක අංශ නිලධාරීන්ට ලබාදී තිබුණු අතර මෙම නිවාසවල පරිපාලනය අමාත්‍යාංශයේ පාලනයෙන් බැහැරව පැවතුණි. | | |
| (ඈ) | නිල මැදුර ගොඩනැඟිල්ල ඉදි කර ඇති ඉඩමේ තක්සේරු වටිනාකම රු.458,900,000ක් වශයෙන් ගිණුම්ගත කර තිබුණු නමුත්, ඉඩම අමාත්‍යාංශය වෙත පවරා ගැනීමේ කටයුතු අවසන් කර නොතිබුණි. | 2023.04.04 දිනැතිව ඉඩම පවරා ගැනීමේ කටයුතු සම්බන්ධයෙන් සිහිකැඳවීම් ලිපියක් යොමු කර ඇත. | ඉඩමේ අයිතිය පවරා ගැනීමට කටයුතු කළයුතුය. |
| (ඉ) | ස්වදේශ කටයුතු අංශය යටතේ පවතින සංචාරක බංගලා 35ක් හා ඊට අයත් ඉඩම් පවරා ගැනීම හා ඒවා තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමේ කටයුතු අවසන් කර නොතිබුණි. | සංචාරක බංගලා, අමාත්‍යාංශය වෙත පවරා ගැනීමට අදාළ කටයුතු සිදු කරන ලෙස අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල දැනුවත් කර ලිපි යොමු කර ඇත. මේ වන විට එම කාර්යාල විසින් ඒ සඳහා අවශ්‍ය පියවර ගනිමින් පවතී. | වත්කම්වල අයිතිය තහවුරු කර ගැනීමට කටයුතු කළයුතුය. |
| (ඊ) | ස්වදේශ කටයුතු අංශය සතු වාහන 08ක් වෙනත් දෙපාර්තමේන්තු හා අමාත්‍යාංශ වෙත ලබාදී තිබුණද එකී වාහන අදාළ ආයතන වෙත විධිමත් ලෙස පවරා දීමට හෝ නැවත ආපසු ලබාගැනීමට කටයුතු කර නොතිබුණු අතර වාහන 04ක් භාවිතයේ නොතිබුණි. | සේවා අවශ්‍යතාවය මත එවකට වෙනත් ආයතන වෙත ලබා දී තිබූ වාහන 08 එම ආයතන වෙතම පවරා දීම සුදුසු බව 2023.05.02 වන දින පැවති විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේ දී සාකච්ඡා වී ඇති අතර ඒ අනුව ඉදිරි කටයුතු කරමින් පවතී. | පවරා දීම කඩිනම් කර වත්කම්වල පැවැත්ම හා ආරක්ෂාව තහවුරු කළයුතු වීම හා වත්කම් ඵලදායීව උපයෝජනය කළයුතුය. |

## 3.4 අනාර්ජීක ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 වර්ෂයට පෙර මිලදී ගෙන තිබුණු Epson L 800 වර්ගයේ ටෝනර් 63ක් කල් ඉකුත් වී භාවිතයට ගත නොහැකිව 2023 අප්‍රේල් 23 දින වන විටත් ස්වදේශ කටයුතු අංශයේ ප්‍රධාන ගබඩාවේ ගොඩගසා තිබුණි. | අමාත්‍යාංශයට අයත් දිස්ත්‍රික් ලේකම් කාර්යාල සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙතින් අවශ්‍යතාව පිළිබඳව විමසීම් කර එම කාර්යාල වලට ලබාදීමේ ඉදිරි කටයුතු දැනට සිදු කරගෙන යනු ලැබේ. | අවශ්‍යතාවය ඉක්මවා මිලදී ගැනීම් සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සිදුකර ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව ක්‍රියාමාර්ග ගතයුතුය. |

## 3.5 කළමනාකරණ දුර්වලතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2014 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛය අනුව මාස 03ක් ඇතුළත ණය ශේෂය නිරවුල් කළයුතු වුවත්, ස්ථාන මාරු වී ගිය ස්වදේශ කටයුතු අංශයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාල 07ක වර්ෂයකට වඩා වැඩි කාලයක සිට අයනොවී පවතින රු.1,781,752ක් ශේෂ 09ක් විය. | පිළිතුරු ලබා දි නැත. | චක්‍රලේඛ උපදෙස් පරිදි ණය ශේෂ කඩිනමින් නිරවුල් කර ගැනීමට පියවර ගතයුතුය. |
| (ආ) | රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අංශවල මියගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු රු.1,070,790ක් වූ ණය ශේෂ 09ක් තුළ වර්ෂ 05කට වඩා වැඩි කාලයක සිට නිරවුල් නොවී පවතින ශේෂය රු.224,187ක් විය. තවද, අමාත්‍යාංශයේ, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන | නීතිමය පියවර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම, නඩු පැවරීම, ඇපකරුගෙන් අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගැනීම, ණය මුදල නිකුත් කළ ලිපිගොනු අස්ථානගත වීම හේතුවෙන් විමර්ශන ආරම්භ කිරීම වැනි ක්‍රියාමාර්ග ගෙන ඇත. | ණය ශේෂ අයකර ගැනීමට කඩිනමින් ක්‍රියාමාර්ග ගතයුතුය. |

අංශවල සේවය හැර ගිය නිධාරීන්ගෙන් අයවිය යුතු රු.3,013,074ක් වූ ණය ශේෂ 28ක් තුළ වර්ෂ 05කට වැඩි කාලයක සිට අයනොවී පවතින එකතුව රු.1,142,762ක් වූ ණය ශේෂ 09ක් පැවැතුණි. එසේම, පළාත් සභා සහ පළාත් පාලන අංශයේ වැඩ තහනම් කළ නිලධාරියෙකුගෙන් වර්ෂ 05කට වඩා වැඩි කාලයක සිට අයනොවී පවතින රු.143,200ක් ණය ශේෂයක්ද පැවැතුණි.

තවද, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ සේවය හැර ගිය එක් නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.91,244ක් ඇපකරුගෙන් අයකර ගෙන ඇත.